**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව - 2023**

**-----------------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ජාතික සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ජාතික සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ජාතික සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ජාතික සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ජාතික සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ජාතික සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ජාතික සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ජාතික සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ජාතික සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ජාතික සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 හි 9 ඡේදයට අනුව අවුරුද්දක කල්පිරීමකින් යුත් රු.10,000,000 ක ස්ථාවර තැන්පතුවක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යාමක් ලෙස නොදක්වා මුදල් හා මුදල් සමාන දෑ යටතේ දැක්වීම හේතුවෙන් අතැති මුදල් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ස්ථාවර තැන්පතු ආයෝජන නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 25 වන වගන්තියට අනුව හුවමාරු නොවන ගනුදෙනුවක් හරහා සමාලෝචිත වර්ෂයේ අත්පත් කර ගත් කැබ් රථයේ සාධාරණ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු නොකර කිසිඳු පදනමකින් තොරව කැබ් රථයේ වටිනාකම රු.6,000,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එසේම එම කැබ් රථය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය රු.588,493ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ලබා දෙන විට නිකුත් කිරීමේ නියෝගයෙහි වටිනාකමක් සඳහන් කර නොමැති බැවින් රක්ෂණ වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර ඇතිබව. | කැබ් රථයේ සාධාරණ වටිනාකම තක්සේරු කර හා එයට අදාල ක්ෂය නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | හුවමාරු නොවන ගනුදෙනුවක් හරහා සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු කැබ් රථයේ වටිනාකම ලෙස හඳුනා ගෙන තිබූ රු.6,000,000 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි තක්සේරු වටිනාකම ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව නිවැරදිව වටිනාකම හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී මෝටර් රථ දෙකක් සඳහා වැයකරන ලද රු.706,655 ක පුනරාවර්තන ස්වරූපයේ වියදම් ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය හා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉකුත් වර්ෂයේ දී ගෙවන රු.165,447 ක රක්ෂණ වාරිකය ඉකුත් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් හා ඉකුත් වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.81,555 ක ලිපිද්‍රව්‍ය වියදම් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු.83,892 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | සමාලෝචිත වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගතකළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හා වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ගෘහ උපකරණ හා සවිකිරීම් ගිණුමේ ශේෂය | 5,272,129 | 5,195,459 | 76,670 | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | ස්ථාවර වත්කම් ලේඛන නිවැරදිව පිළියෙල කර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |
| (ආ) | ආපදා ණය ශේෂය | 3,520,934 | 3,692,947 | 172,013 | දේපළ පිරියත උපකරණ උපලේඛනය නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | නිවැරදි උපලේඛන පදනම් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තියෙහි (අ) , (ආ) | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය මත ආයතනයේ මුදල් ආයෝජනය කල යුතු වුවත්, ජාතික සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී රු. 10,000,000 ක මුදල් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2024.06.24 දිනෙන් කල් ඉකුත් වන මෙම ස්ථාවර තැන්පතුව නැවත ආයෝජනය නොකර ආයතනයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් පියවා ගැනීම සඳහා උපයෝගී කර ගැනීමටත් එහි ඉතිරියක් වෙතොත් වර්ෂ අවසානයේදී ඒකාබද්ධ අරමුදලට බැර කිරීමටත් පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | මුදල් පනත ප්‍රකාරව මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය මත ආයතනයේ මුදල් ආයෝජනය කළයුතුය. |
| (ආ) | 2024 පෙබරවාරි 05 දිනැති අංක F/FR/05/NHRDC/General/03/20 දරන රාජ්‍ය පරිපාලන හා, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ ලිපිය | ජාතික අයවැය ඇස්තමේන්තු මගින් 2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන ලබා දී ඇති අරමුදලින් 2023 දෙසැම්බර් 31 දිනට ඉතිරි වී තිබූ රු.3,589,644ක මුදල කඩිනමින් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලෙස දන්වා තිබුණද එම ඉතිරි මුදල් 2024 වර්ෂයේ වියදම් දැරීම සඳහා උපයෝගී කර ගෙන තිබුණි. | පෙබරවාරි මාසයේ සිට මේ දක්වා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් අක්මුදල් නිදහස් කිරීමට අමාත්‍යාංශය මගින් නිර්දේශ නොකල බැවින් ආයතනයේ වැටුප් ගෙවීම් ඇතුළු අනෙකුත් වියදම් 2023.12.31 දිනට ඉතිරිව පැවති මුදලින් දැරීමට කටයුතු කරන ලද බව | 2023 දෙසැම්බර් 31 දිනට ඉතිරි වී තිබූ මුදල් කඩිනමින් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන මුදල් අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | ධාවන තත්ත්වයේ නොපවතින වාහන අපහරණය කිරීම හෝ අළුත්වැඩියාකර භාවිතයට ගැනීම කඩිනමින් සිදුකල යුතු වුවත් ජාතික සභාවේ වැන් රථයක් 2023 ජනවාරි 16 වන දින සිට විගණිත දිනය වූ 2024 මැයි 10 වන විටත් එම වාහනය යථා තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැන් රථයේ අළුත්වැඩියා කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කොට ගෙන ඉදිරියේ දී අළුත්වැඩියා කිරීමට නියමිත බව. | ධාවන තත්වයේ නොපවතින වාහන අපහරණය කිරීම හෝ අළුත්වැඩියා කර භාවිතයට ගැනීම කඩිනමින් සිදුකල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු1,370,102 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.550,915 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.819,187 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයෙහි විදුලි වියදමෙහි හා ක්ෂය වියදමෙහි වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය පිහිටුවා වසර 25 ක් ගත වී ඇතත් 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ පනතේ 14(1) වගන්තිය අනුව ජාතික සභාව පිහිටුවීමේ මූලික අරමුණුවලින් එකක්වන ජාතික මානව සම්පත් සංවර්ධනය කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කිරීමේ කාර්යය අවසන් ප්‍රතිඵලය ලභා කර ගැනීමට 2023 දෙසැම්බර් 31 දින වන විටත් අපොහොසත් වී තිබුණි. | මානව සම්පත් සංවර්ධනය සහ සේවා නියුක්තිය පිළිබඳ රජයේ අනුමත ප්‍රතිපත්තිය මත පිහිටා ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | ප්‍රධාන අරමුණ ඉටුකිරීම සඳහා ඵලදායි ක්‍රියාමාර්ග ගනිමින් ආයතනය පිහිටුවීමේ අරමුණු සාක්ෂාත් කරගත යුතුය. |
| (ආ) | ආයතනයේ මූලික අරමුණ ඉටු කර ගැනීමට උපකාරී වන මානව සම්පත් සංවර්ධනයට අදාල විවිධ ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු ඇතුලත් දත්ත බැංකුවක් පවත්වා ගැනීම පනතේ 16(2)ඇ සහ 16(2)ඊ වගන්ති අනුව සිදු කල යුතු දත්ත බැංකුවක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් පවත්වා ගෙන නොතිබුණි. | එම තොරතුරු යාවත්කරණය සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක අවශ්‍යතාවය පවතින බැවින් සභාවට අත්‍යවශ්‍යම අංශයක් වන මේ සඳහා කාර්ය මණ්ඩලයේ නව තනතුරු කිහිපයක් ස්ථාපනය කර ගැනීමේ ක්‍රියාවළිය ආරම්භ කර ඇති බව. | පනතේ දක්වා තිබෙන කාර්යයන් ඉටුකිරීම කෙරෙහි මූලිකවම අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) | මානව සම්පත් සංවර්ධනය කිරීමට අදාල ප්‍රතිපත්ති උපනයනය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ ජාතික සභාවේ රැස්වීම් ඉකුත් වර්ෂයේ වාර 5ක් හා සමාලෝචිත වර්ෂයේ වාර 02 ක් පවත්වා තිබුණද එම රැස්වීම්වල කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් පනතේ 10(5) වගන්තිය අනුව කාර්යය පටිපාටියක් අනුමත කර නොතිබුණි. | රැස්වීම් පැවැත්වීම් සම්බන්ධයෙන් හා එම රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය විධිමත් කර ගැනීම සඳහා කටයුතු දැනටමත් ආරම්භ කර ඇති බව | රැස්වීම්වල කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් කාර්යය පටිපාටියක් කඩිනමින් සකස් කරගත යුතුය. |
| (ඈ) | 2021 අප්‍රේල් 27 වන දින සිට ජාතික සභාවේ පුරප්පාඩු වී තිබුණු අධ්‍යක්ෂ තනතුර සඳහා නව නිලධාරියෙකු බඳවා ගැනීමට අපොහොසත් වී තිබුණි. | තෝරාගත් නිලධාරිනිය දැනට සේවය කරන ස්ථානයෙන් ඇයට ඉල්ලා අස්වීමේ දී ඇති වූ ගැටලුවක් හේතුවෙන් වැඩ භාරගැනීම කල නොහැකි බව දැනුම් දී ඇති බව. | විධිමත්ව බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ජාතික සභාවේ අරමුණු ඉටු කිරීමේදී විවිධ ක්ෂේත්‍රයන්හි පර්යේෂණයන් සිදු කිරීම අත්‍යාවශ්‍ය කාර්යයක් වූ බැවින් ඒ සඳහා මූලිකත්වය ලබා දීම සඳහා සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ) නිලධාරියෙකු අනිවාර්යයෙන්ම සභාව තුල සිටිය යුතු වුවත් 2020 ඔක්තෝබර් 31 දින සිට විගණිත දිනය වූ 2024 මැයි 15 දින වන විටත් එම තනතුර සඳහා නිත්‍ය නිලධාරියෙකු බඳවා ගැනීමට නොහැකි වී තිබුණු අතර 2021 අගෝස්තු 03 දින සිට වැඩ බැලීමේ පදනම මත නිලධාරිනියක පත් කර තිබුණි. | සංවිධාන ව්‍යුහය සංශෝධනය සඳහා අනුමැතිය ලබා ගෙන ඇති බව හා මේ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට අවශ්‍ය සංශෝධන දැනට සිදුකරමින් පවතින බව. | අත්‍යවශ්‍ය බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2. වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේදී රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් ජාතික සභාවට ලබා දී තිබූ මෝටර් රථයක් 2024 මැයි 10 දින වන විටත් සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | සභාව වෙත තාවකාලික පදනම මත ලබා දී ඇති PB-0286 කැබ් රථය ඉදිරියේ දී පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව. | සභාවේ කටයුතු සඳහා පරිහරණය කරනු ලබන පවරා නොගත් කැබ් රථය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |